සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S I,II

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

II ශ්‍රේණිය
Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II
Sinhala language and literature - I,II

පැය තුනයි
Three hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. මඬේ හිටවපු ඉන්න වගේ වැඩ කිරීම සමහරුන්ගේ ප්‍රතිපත්තියයි.
(1) ස්ථිර ප්‍රතිපත්තියක් නැතිවීම (2) කිසිම ප්‍රයෝජනයක් නොලැබීම
(3) අවදානම් වැඩක් අනුන් ලවා කරවීම (4) කොතැන ගියත් ගතිගුණ වෙනස් නොවීම

02. ආවාට ගියාට වැඩ කිරීම දියුණුවට බාධාවකි.
(1) ඉක්මනින් ආපසු යෑම (2) අධික බියට පත් වීම
(3) අනතුරක සේයා පහළ වීම (4) ඕනෑවට එපාවට වැඩ කිරීම

03. ඔහු තැනේ හැටියට ඇණේ ගහන්න දක්ෂයෙකි.
(1) වැඩේ නොකෙරෙන තැනට කල් දැමීම (2) තැනට ගැළපෙන ලෙස වැඩ කිරීම
(3) කිසිවකුට නොකියා පලා යාම (4) නිෂ්ඵල වැඩක් කිරීම

- අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. අතීතයේ දී අධ්‍යාපනය හැදෑරූ දරුවෝ පොතපත .................................................................. කළහ.
(1) විමර්ශනය (2) පරිශීලනය (3) නිරීක්ෂණය (4) විචාරය

05. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනයේ .................................................................. විය.
(1) ආරම්භකයා (2) නිර්මාපකයා (3) පුරෝගාමියා (4) ආදිතමයා

06. කාව්‍යකරණය සඳහා අත්දැකීම් .................................................. කිරීමේ දී ඖචිත්‍යයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.
(1) විදාරණය (2) විස්තාරණය (3) නිර්මාණය (4) ප්‍රතිනිර්මාණය

07. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) ගැටබෙරය, තාලම්පට, මද්දලය, හක්ගෙඩිය (2) තද්ධිත, කෘදන්ත, තද්භව, තත්සම
(3) කැත්ත, උදැල්ල, පොරව, පිහිය (4) පොත, පැන, කංචුකය, පැන්සල

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) අළුයම, සඳලුතලය, නිත්‍යානුකූල, පරිගණකය (2) අබිමන්, කණිෂ්ඨ, අළු කෙසෙල්, කළුවර
(3) ගැටලු, සමස්ත, දූරකථනය, සණ්ටාරය (4) නිමේෂය, කුරුළු කූඩුව, අභිලාෂය, අරුණලු

09 එක් එක් වචනයේ දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය හා ගැට ඇටපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න..
(1) තලිය, පිඩැලි, යාකෘතය, අනූන (2) තලිය, අනූන, පිඩැලි, යාකෘතය
(3) පිඩැලි, තලිය, අනූන, යාකෘතය (4) පිඩැලි, අනූන, යාකෘතය, තලිය

10. 'සියපත්' යන්න අයත් වන්නේ,

(1) විශේෂණ සමාසයට ය. (2) විභක්ති සමාසයට ය.

(3) අන්‍යාර්ථ සමාසයට ය. (4) ද්වන්ද්ව සමාසයට ය.

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමයෙක්, කාන්තාවක, ඔවුහු, ගුරුවරු (2) මිනිසුන්, අලියෙක්, වෛද්‍යවරු, ඔවුන්

(3) මම, නීතිඥවරයකු, ගොවියෙක්, වඩුවෙක් (4) කුරුල්ලෙක්, එළදෙනක්, මිනිස්සු, අපි

12. 'අධ්‍යාපන + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) ආධ්‍යාපතික (2) අධ්‍යාපතික (3) ආධ්‍යාපනික (4) අධ්‍යාපනික

13. "විවාහ ජීවිතයට පිවිසුණු විට දරුවෝ දෙමව්පියන්ගෙන් වෙන්ව ජීවත් වෙති." යන වාක්‍යයේ 'දෙමව්පියන්ගෙන්' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) සම්ප්‍රදාන විභක්තිය (2) ප්‍රථමා විභක්තිය (3) අවධි විභක්තිය (4) කර්ම විභක්තිය

- **14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවරදිව දැක්වෙන උත්තරය තෝරන්න.**

14. බස දන්නා සියලු දෙනාට නිර්මාණ විෂයෙහි මෙන් වින්දන විෂයෙහි ද **පරිචය** ඇති නම් මැනවි.

(1) අත්දැකීම (2) කුසලතාව (3) ශක්‍යතාව (4) පළපුරුද්ද

15. සුනේත්‍රාගේ හඬින් සේනාධීරගේ සිතෙහි ඇති වන **ප්‍රහර්ෂය** අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් කුළු ගන්වයි.

(1) වේදනාව (2) බලපෑම (3) සන්තෝෂය (4) වෙනස්වීම

16. 'ත' යනු **දන්තජ** අක්ෂරයකි

(1) තොල්වලින් හටගන්නා (2) දත්වලින් හටගන්නා

(3) බොටුවෙන් හටගන්නා (4) මුදුනෙන් හටගන්නා

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නො වන පදයක් සහිත වරණය තෝරන්න.

(1) කෘදන්ත - නැටිලි, ගැයිලි, දිවිලි, හෙරලි (2) තද්ධිත - දිරිමත්, සිරිමත්, නැණවත්, බලවත්

(3) සන්ධි - මුලසුන, දැත, මැත, දකුණත (4) විධි ක්‍රියා - එන්න, දුවන්න, බල, නටන්න

18. දි ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

(1) කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ (2) කේන්ද්‍රය, චාපය, විෂ්කම්භය, අරය

(3) තිත, කොමාව, දෙතිත, තිත්කොමාව (4) ආගමය, ලෝපය, ආදේශය, ශීඝ්‍රය

19. එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ** යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) වත - වස්ත්‍රය, අනංගයා - කුසුමසරා, උත්තම - අධම, ගින්න - අනල

(2) මොනරා - මියුරු, මුහුද - අර්ණවය, වර්ණ - අකුරු, අඹ - ජලය

(3) පිපි -විකසිත රවි - චන්ද්‍ර, චංචල - සසල, මිත්‍රයා - සබඳ

(4) විසල් - කුඩා, පටිපාටිය - පිළිවෙළ, දේදුන්න - සුරසැව්, රත්රන් - කසුන්

20. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සඳ - උළිඳු, තරුපති, තුසරකර, නිසයුරු (2) ප්‍රසිද්ධ - පතළ, පළ, පවර, පරසිඳු

(3) නෙළුම් - පංකජ, විමල, අම්බුජ, කමල (4) හිරු - දිනකර, දිනිඳු, රවි, නුබමිණ

21. **විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.**

(1) රහිත -විරහිත (2) ජාතික - විජාතික (3) ප්‍රාචීන - ප්‍රතිචීන (4) පුරාතන - අද්‍යතන

22. **මිශ්‍ර ක්‍රියාවක් යෙදි ඇති වාක්‍යය කුමක් ද?**

(1) නුසුදුස්සන් ඉදිරියෙහි දණින් නොවැටෙනු. (2) මඟීන් පිරි බස් රිය අනතුරකට ලක්විය.

(3) මං ගියේ පයින් දරුව මගේ ! (4) ළමයි අත්පොළසන් දෙමින් තරඟය නැරඹූහ.

23. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'මම' යන්න උත්තම පුරුෂ ඒක වචන නාම පදයකි.
(2) 'තොමෝ' යන්න ස්ත්‍රී ලිංග ගෞරවාර්ථ පදයකි.
(3) 'ඔවුන්' යන්න අනුක්ත නාම පදයකි.
(4) මෙන්, සේ, වැනි යනාදී පද නිපාත පද වේ.

24. මහප්‍රාණ අක්ෂරයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සමස්ත (2) අර්බුදය (3) වර්ධනය (4) ශිෂ්ටාචාරය

25. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන කවියාගේ නම තෝරන්න.
(1) ලි ම ඩ ග කු (2) හු අ බු අ දූ (3) රි ගුං ණ හ සි (4) මා ර කු ග ම ම

- අංක 26 , 27 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

26. දී කිරට බළල්ලුත් සාක්කිලු.
(1) අරමුණක් නැතිව යමක් කිරීම (2) කිසියම් උපායකට හසුවීම
(3) යමක් දෙස වුවමනාවෙන් බලා සිටීම (4) වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම

27. අතු කඩා මොර කන්නා සේ
(1) පහසු තැනක් අපහසු බව දැනීම
(2) අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම
(3) වැඩි ප්‍රයෝජන ලබන්නට ගොස් තිබෙන ටිකත් නැති වීම
(4) මහලු වියේ දී කවුරුත් සිල් රකිති

28. A - ග්‍රාමෝදය - ගාත්‍රාදේශ සන්ධිය
B - යනෙන - පූර්ව ස්වර ලෝප සන්ධිය
C - නිරවුල් - ද්විත්ව රූප සන්ධිය
D - සිහිනිඟ - ස්වර සන්ධිය
A, B, C, D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) C හා D ය. (2) A හා D ය. (3) B හා D ය. (4) B හා A ය.

- අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) මා සමග අම්මා කඩයට ගියා ය. (2) මම සමඟ අම්මා කඩයට ගියා ය.
(3) මා සමඟ අම්මා කඩයට ගිය හ. (4) මම සමඟ අම්මා කඩයට ගියෙමි.

30. (1) මා එය කියවා ඇත්තෙමි. (2) ඔහු ලේඛකයෙකු ද?
(3) අහසේ තරු බබළති. (4) ඔවුහු ක්‍රීඩකයෝ වෙති.

31. A - මව දරුවන් .................................................. ගමට ගියා ය.
B - දෙගුරුන් .................................................. කවරෙක් දරු දුක උසුලත් ද?
C - තොප .................................................. වෙන සරණක් මට නැත.
D - උගත් ශිල්ප ශාස්ත්‍ර .................................... ඔබට අන් කවර පිහිටක් ද?
E - හැර F - මිස G - කැටුව H - විනා
(1) F, E, G, H (2) G, H, E, F (3) E, H, F, G (4) H, E, F, G

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං පොළේ ගිහිල්ලා එළෝළු ටිකක් අරන් ආවා."
(1) මම වෙළඳ පොළට ගොස් එළවළු රැගෙන පැමිණියෙමි.
(2) මා වෙළඳ පොළට ගොස් එළවළු රැගෙන පැමිණියෙමි.
(3) මම වෙළඳ පොළට ගිහින් එළවළු රැගෙන පැමිණියෙමි.
(4) වෙළඳ පොළට ගිය මා එළවළු රැගෙන පැමිණියෙමි.

33. "අකීකරු පුත්‍රයකුගේ ලෝකය" නමැති පද්‍ය නිර්මාණය

(1) මහගමසේකර (2) ඒ.වී. සුරවීර

(3) පරාක්‍රම කොඩිතුවක්කුගේ ය. (4) සිරිගුණසිංහ

34. රූපකයක් රහිත වරණය තෝරන්න.

(1) සසර සයුර තරණය කළ බුදු පියාණනේ

(2) ගත රැඳී දුහුවිලි රනබරණයි - දහදිය මඩ විලවුන් සුවඳයි

(3) එතෙපුල් නමැති අමාහැල්ලෙන් කෝ ගිනිකඳ නිවී ගිය

(4) සින්ධූපමාන වැව් තලා මතින් ඇදී

35. "චිරන්තන සාහිත්‍යික උක්තීන් භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා උත්සාහ කරන්නේ ධ්වනිපූර්ණ යෙදුම් මගින් චමත්කාරයක් දනවීමට යි." යන පාඨයෙහි 'උක්තීන්' යන වචනයේ අර්ථය කුමක් ද?

(1) වදන් (2) කියමන් (3) අලංකාර (4) නිරුක්ති

36. පහත සඳහන් කවියේ දෙවෙනි පදය සම්පූර්ණ කරන්න.

වඩිමින් සවස නල හැසිරෙන දිගතු වල

........................................................................

පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල

විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

(1) අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ

(2) ලකල ගුවන් නලසිරි යහන නිකසළ

(3) සොබමින් සුනිල් මිණි නිල් නුබ තුර විපුල

(4) උදුළ සොම් විලසින් සැදෙන තුරු වැළ

37. "දරුව ඇඳගෙන ඉන්නෙ කඩමාලු" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(1) හුණුවටයේ කතාව (2) සිංහබාහු (3) තලමල පිපිලා (4) ගුරතරුව

38. මොනරාගල ප්‍රදේශයේ භාෂා ව්‍යවහාරයේ දී 'කුදහප' යනු

(1) දුවපන් (2) පලයන් (3) කාපන් (4) නිදාගනින්

39. පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවේ පෙරළී ඇත
මිදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ

මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය
ඉඳහිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩු බුරනු ඇසේ

මෙම කවියෙන් කියැවෙන්නේ,

(1) බල්ලකු ගැන ය. (2) උපාසකම්මා කෙනෙකු ගැන ය.

(3) මිදුලෙ පහන් පැල ගැන ය. (4) නිවී ගිය පහන් දැල්ලක් ගැන ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

" සාහිත්‍යය නිර්මාණ අතරින් කවිය හෙවත් කාව්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ."

(1) කවිය යනු සුවිශේෂී සාහිත්‍ය නිර්මාණයකි

(2) කවිය නිසා සාහිත්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ.

(3) කවියට සාහිත්‍ය නිර්මාණ අතරින් විශේෂ ස්ථානයක් හිමි වේ.

(4) සාහිත්‍යය නිර්මාණවලට කාව්‍යයේ සුවිශේෂී ස්ථානයක් හිමි වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S II

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය - II
Sinhala language and literature - II

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

- අංක (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) ප්‍රධාන (ආ) ප්‍රදාන

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

ජලාශ්‍රිත ශිෂ්ඨාචාරයේ න්‍යෂ්ටිය වූ වැව් හා වාරි මාර්ග ඉදිකිරීමේ දි භූ ව්‍යුහය, ජල වහනය හා දේශගුණික ලක්ෂණ පිළිබඳ ව බෙහෙවින් සැලකිලිමත් වී ඇත.

(අ) ........................................................ (ආ) ........................................................

(iii) පහත සඳහන් විවිධාර්ථවත් පද සඳහා එක් අර්ථයක් බැගින් ලියන්න.

(අ) සමය (ආ) වැසි

(iv) පහත සඳහන් අදහස් වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) බාහිර මෙහෙයවීමක් නොමැතිව ක්‍රියා කරන -

(ආ) අසා රස විඳීමේ අරමුණෙන් ලියන ලද -

(v) පහත සඳහන් පද සන්ධි කර අදාළ සන්ධි වර්ගය ලියන්න.

(අ) උද්‍යාන + අක් (ආ) වචන + අර්ථ

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් ය. නිදොස් කර නැවත ලියන්න.

(අ) පැරණි කවින් ගැමි හදවත් හඳුනා ගතිමින් කවි ලියූහ.

(ආ) ඔහු ප්‍රවීණ සාහිත්‍යධරයෙක් මෙන් ම දක්ෂ ගොවියෙක් ද විය.

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇති නිපාත පද දෙකක් උපුටා ලියන්න.

ලියෝ ටෝල්ස්ටෝයි නම් වූ රුසියානු මහා ලේඛකයා ස්වකීය නිර්මාණ කෞශල්‍යයෙන් හා අසමසම ප්‍රතිභාවෙන් සාහිත්‍ය ලෝකය ඒකාලෝක කළේ ය.

(viii) පහත සඳහන් අක්ෂර කාණ්ඩ හඳුන්වන්න.

(අ) (අ)ඃ, ශ, ෂ, ස, හ, ෆ -

(ආ) ත, ථ, ද, ධ, න, ඳ, ල, ස -

(ix) ප්‍රාදේශීක ව්‍යවහාරයේ යෙදෙන පහත සඳහන් පදවලට පොදු ව්‍යවහාරයේ යෙදෙන අදහස ලියන්න.

(අ) යා කොය් -

(ආ) ගහමච්චා -

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරයට හරවා ලියන්න.

(අ) රෝගීහු වෛද්‍ය උපදෙස් පැතූහ (ආ) ජයග්‍රහකයෝ සතුටින් ඔල්වරසන් දෙති

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. (ල. 25)

(අ) කෘත්‍රිම පොහොර භාවිතය හා පළිබෝධ නාශක භාවිතයත් සමග ආහාර ද්‍රව්‍යවල ගුණාත්මක බව අද ගිලිහී ගොසින් ය. නිරෝගිමත් ජනතාවක් රටට දායාද කිරීම උදෙසා මෙය ප්‍රබල තර්ජනයකි. මේ පිළිබඳ ජාතික වැඩ සටහනක අවශ්‍යතාව ඉස්මතු වී ඇත. ඒ සඳහා කාලය එළඹ ඇති බව අපි සැම සිතට ගනිමු.

(ආ) මිනිසා සමාජ ජීවියෙකි. එබැවින් සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා සංවාදයේ දී තමා කතා බහේ යෙදෙන අයගේ තරාතිරම, වයස, පූජනීයත්වය ආදිය සැලකිය යුතුය. තමන්ගේ ප්‍රතිරූපය රකිමින් සමාජශීලී ප්‍රියමනාප චරිතයක් ගොඩනගා ගැනීමට සංවාද භාවිතයේ දී ප්‍රිය මනාප ව භාෂාව උපයෝගී කර ගනිමු.

(ඉ) දිනකට සිදුවන මාර්ග අනතුරු ප්‍රමාණය දිනෙන් දින වැඩිවන බව අසන්නට දකින්නට ලැබේ. වාහන අධිකවීමත් සමග සිදුවන තරගය හා නීතියේ දුබලතා, පදිකයන් මෙන්ම රියදුරන්ගේ නොසැලකිලිමත් බව මේ සඳහා බලපායි. කවර හේතුවකින් වුවද අහිමි වන්නේ වටිනා මිනිස් ජීවිත රැසකි. නීතියත්, උපදේශනයත් බලගන්වා මාර්ග අනතුරු මැඩ පැවැත්විය යුතුය.

(ඊ) "පරිසරය ලොව සැමගේ අම්මාය. එබැවින් අපි ඇයට පෞද්ගලිකව ද ආදරය කළ යුතුවෙමු." මේ වටිනා කියමනට අනුව සිතිය යුත්තේ වර්තමානයේ මෙය සිදුවනවා ද යන්න ය. පරිසරය රැකීමෙන් මිනිසාට සිදුවන අහිතකර බලපෑම් රැසකින් මිදීමට පුළුවන. අනාගත පුරවැසියාට එහි උරුමය විඳින්නට පරිසර හානි අවම කර ගනිමු.

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය වචන 50 - 55 ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන ගණන සාරාංශයේ අග ලියන්න.

භාෂාව යනු පුද්ගලයා සතු විශිෂ්ට සන්නිවේදන මෙවලමයි. මිනිසා අන් සතුන්ගෙන් වෙන් කර දැක්වීමේ දී ගත හැකි ප්‍රබලතම සාධකය වන්නේ භාෂාවයි. භාෂාව කවදා කොහේ දී බිහි වී ඇත්දැයි නිශ්චිත ව ම ප්‍රකාශ කළ නොහැකි නමුත් මිනිස් සන්නිවේදනය වඩාත් පුළුල් වීමටත් වඩාත් සාර්ථක වීමටත් ප්‍රබල සාධකයක් වී තිබේ.

මානව ශිෂ්ටාචාරයේ මුල් කාල පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් අපට භාෂණයේ හා ලේඛනයේ ප්‍රභවය හැඳින ගත හැකිය. වර්තමාන සමාජය තුළ මෙන්ම එදා අතීත සමාජය තුළ ද මානවයා සිය අදහස් තවකෙකුට ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව බරපතල ලෙස පවතින්නට ඇත. වඩාත් සරල සංඥා හා සංකේත භාවිතයෙන් ඔවුන්ගේ අදහස් හුවමාරු කර ගත්ත ද භාෂණ රටාවක් හෝ ලේඛන රටාවක් හෝ සංකීර්ණ සන්නිවේදන ක්‍රමෝපායක් එදා ඔවුන් සතුව නොතිබිණි. භාෂාව බිහි වීම සමාජයේ දැඩි අවශ්‍යතාවක් සපුරාලන්නක් විය.

තාක්ෂණික සංවර්ධනයත් සමග ජනමාධ්‍ය බිහි වූ අතර ඒ නිසාම භාෂා භාවිතයේ නව මං විවර විය. අතීත මානවයා සිතීමට, කතා කිරීමට හා ලිවීමට භාවිත කළ භාෂාව ජනමාධ්‍ය බිහිවීමත් සමග පුළුල් භාවිතයකට යොමු විය.

(ලකුණු 10)

04 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

කිසිවකුගේ සිත තුළ පහළවන ඔහුට ම විශේෂ වූ සිතිවිල්ලක් අන්‍යයන්ගේ සිත්වලට දැනවීම සඳහා මෙම පුද්ගලයාටත් ඔහුගේ සිතිවිල්ල දැනවීම අවශ්‍ය වන අන්‍යයන්ටත් පොදු වූ මාධ්‍යයකට එම සිතිවිල්ල පරිවර්තනය කළ යුතු වේ. එම පොදු මාධ්‍ය භාෂාවයි. භාෂාවෙන් හැර ඉඟි බිඟි මඟිනුත් ඇතැම් සිතිවිලි හුවමාරු කරගත හැකිය. එහෙත් එසේ හුවමාරු කර ගත හැක්කේ ඉතා සීමා සහිත සිතිවිලි සංඛ්‍යාවක් පමණි. එම සිතිවිලි ද ඉතා දළ වශයෙන් මිස සියුම් අන්දමින් ඉඟි මඟින් ප්‍රකාශ කළ හැකි නොවේ. මෙසේ භාෂාව ජන සමූහයක් විසින් පොදුවේ පරිහරණය කෙරෙන මාධ්‍යයක් බව පැහැදිලි වේ. කිසියම් භාෂාවක් පොදුවේ පරිහරණය කරන හෙයින් ජන සමූහයන් එකමුතුකමක් දරන බව ලෝකයේ විවිධ දේශයන් විවිධ ජන සමූහයන් පරීක්ෂා කිරීමේ දී දිස්වන කරුණකි. අප දිවයිනේ වෙසෙන ජනතාව පරීක්ෂා කළහොත් පොදු භාෂාව නිසා සිංහල හා දෙමළ වශයෙන් ජන සමූහ දෙකක් පවත්නා අයුරු අපට පෙනේ. මෙසේ පොදු භාෂාවක් නිසා එකමුතු බව ලැබූ ජන සමූහයකට භාෂා ප්‍රජාව යැයි නම් කළ හැකිය. මෙසේ ලංකාවේ සිංහල භාෂා ප්‍රජාව හා දෙමළ භාෂා ප්‍රජාව යනුවෙන් ප්‍රධාන භාෂා ප්‍රජාවන් දෙකක් දක්නට ලැබේ. භාෂා ප්‍රජාව භූගෝලීය වශයෙන් හෝ රාජ්‍ය වශයෙන් හෝ අඛණ්ඩ ව එක ප්‍රදේශයකට පමණක් සීමා වී පැවතිය යුතු නොවේ.

(i) භාෂා ප්‍රජාව යනුවෙන් පැහැදිලි වන්නේ කුමක් ද?

(ii) ජන සමූහයක එකමුතු බවට හේතුව කුමක් ද?

(iii) පොදු මාධ්‍යයක් අවශ්‍ය වනුයේ කුමක් සඳහා ද?

(iv) මෙම ඡේදයේ දැක්වෙන අන්දමට භාෂා ප්‍රජාවේ ව්‍යාප්තියේ ස්වරූපය කෙසේ ද?

(v) මෙහි දැක්වෙන අන්දමට ප්‍රධාන භාෂා ප්‍රජාවන් දෙක නම් කරන්න.

(ලකුණු 2 x 5 = 10)

05 උතුරු මැද පළාතේ මීගස්වැව ගම්වාසීන්ට මහත් ගැටලුවක් වී ඇත්තේ ආසන්නයේ පිහිටා ඇති ප්‍රාදේශීය රෝහලේ අපද්‍රව්‍ය පුළුස්සා දැමීමේ ක්‍රියාදාමයයි. එකී අපද්‍රව්‍ය පුළුස්සා එහි දුම බටයක් ඔස්සේ මුදා හරී. මෙම දුම නිසා ප්‍රදේශයේ ජනතාව විවිධ ශ්වසන රෝගවලට ගොදුරු වෙති. ඔබ, ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතා මේ පිළිබඳ විසඳුමක් ලබාදෙන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය අධිකාරිතුමාට යවන ලිපිය සකස් කරන්න.

**නැතහොත්**

විජිතපුර මධ්‍ය මහා විද්‍යාලයේ 2019 - 03 - 28 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.00 දක්වා ප්‍රධාන ශාලාවේ දී පැවැත්වෙන සාහිත්‍ය කලා මහෝත්සවයෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වන්නේ සාහිත්‍යසූරී ගුණපාල මහතාය. සාහිත්‍යය මාසයට සමගාමීව 2018 වසරේ පළාත් සාහිත්‍ය උත්සවයේ කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ ජයග්‍රාහකයින්ට ත්‍යාග හා සහතික පත්‍ර ලබාදීම මෙහි දී සිදුවේ. විදුහලේ සිසු සිසුවියන්ගේ නැටුම් ගැයුම් කිහිපයක්ම උලෙළ වර්ණවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීමට සාකච්ඡා විය. මෙදින පැවැත්වෙන උත්සවය සඳහා න්‍යාය පත්‍රය සකස් කරන්න. (ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

21 S III

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය - III
Sinhala language and literature - III

පැය දෙකයි
Two hours

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) එන්නේ කොහි සිට ද - කොතැනකට ද යන්නේ
ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ
මිනිසුන් ගිහින් නිතර ම ආපසු එන්නේ
කිම දුයි කියා කිසිවකු ඇයි? නොසොයන්නේ

(අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් පද්‍ය පන්තියේ නම ලියන්න.

(ආ) එම කවි පෙළෙහි රචකයා නම් කරන්න.

(ii) "ආශ්චර්ය යැ ! වහන්සෙ, අද්භූතයැ ! වහන්සෙ, යම් තාක් අදාන්ත සතුන් දමන දෑ යැ."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයක දී ද?

(iii) (අ) අනුරාධපුර යුගයේ ලියැවුණු සංයුක්ත නිකායට්ඨ කථාව කුමක් ද?

(ආ) උපදේශත්මක ජනකවි හඳුන්වන වෙනත් නමක් දක්වන්න.

(iv) (අ) පන්සිය පනස් ජාතක පොත ලියැවුණේ කාගේ අනුග්‍රහයෙන් ද?

(ආ) සතර කන් මන්ත්‍රණය පාඩමෙහි සඳහන් වන පරිදි ධර්ම යුද්ධය යනු කුමක් ද?

(v) "ඉස්සර වෙලා කඹුරුපිටියට ගිහින් ඊට පස්සේ බස්නා ඉර පැත්තට යන්ඩ ඕනෑ තංගල්ලට යන මහ පාර දිගේ."

(අ) ඉහත සඳහන් ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) බස්නා ඉර පැත්තට යන්න යයි කීවේ කුමන ස්ථානයකට යාමට ද?

(vi) පිය සන් නො ව බිඟු දූල් රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම කුහුලී
මද සන් සුන් පියොවින් සිටි නොසැලී

(අ) මෙහි ඉතිරි කවි පදය ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(vii) "එසේ ය. අනික් කාට කියම් ද? තොප ම කොට ඇව්දිනා කටයුතු හෙයින් තොප ම අරහයා කියමි."

(අ) ඉහත සඳහන් උද්ධෘතය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

(ආ) එම කෘතිය ලිවීම සඳහා ඇසුරු කර ගත් ග්‍රන්ථය නම් කරන්න.

(viii) (අ) 'සිංහබාහු' නාට්‍යය කුමන නාට්‍ය සම්ප්‍රදායට අයත් නාට්‍යයක් ද?

(ආ) ඒ සඳහා තේමාත්මක කතා පුවත වී ඇත්තේ කුමක් ද?

(ix) නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත, නුඹ වේ
ඒ බව සිහි කොට මෙ ලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ

(අ) ඉහත පද්‍යය ඇතුළත් පැදි පෙළ රචනා කළෝ කවරහු ද?

(ආ) මෙම කවියාගේ මුල් ම කාව්‍ය කෘතිය නම් කරන්න.

(x) (අ) අමාවතුර රචනා කිරීමේ අරමුණ කුමක් ද?

(ආ) අමාවතුර රචනා කිරීම සඳහා මුල් කර ගත් බුදු ගුණය කුමක් ද?

(ලකුණු 2 x 10 = 20)

02 පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) උග්ගසේන සිටුපුත්‍රයාණෝ ද කර'ග රහත් වන්නා සේ නො වන බව මුත් හුණදඬු අග දී පිළිසිඹියා පත් රහත් ව හුණදණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොසින් පසඟ පිහිටුවා වැඳගෙන මහණ කරන්ට ආරාධනා කළහ.

(අ) මෙම පාඨයෙහි අවස්ථා සම්බන්ධය ලියන්න.

(ආ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ii) සඟවන්නට තතු බැරි ය පුතුගෙන්
මිහිඳා නිතින සොඳිනා පෙනෙන විලසා
අදහන්නෙ නැත කීව ද මුසා
නැණ මුකුරා ගොස් ඇත පුරා වයසා

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) පුතුගෙන් කරුණු සැඟවිය නොහැකි බවට හේතු දෙකක් ලියන්න.

(iii) දිමුතු යසස් වන් කුසුම සරාගේ
නුමුතු සුවඳ මල් පැලඳ සරාගේ
දකුතු රඟන රඟ සුරඟන රඟ ලාගේ
උමතු නො වෙ ද කෙලෙසක සිත කාගේ

(අ) අනංගයා, හිස් මුදුනේ යන පද සඳහා කවියා භාවිත කර ඇති වචන දෙක ලියන්න.

(ආ) කවියේ අර්ථය ලියන්න.

(iv) රජ 'පැවිපියනට දරුණු කැමින් ලද නම් කියනු නො යෙදෙයි. මවුපියන්ගෙ ගොත් විසින් බැවැහර කරනු මැනැවැ'යි සිතා" වහන්සෙ, තොප පියෙ කවර? මවු කවර? යි පිළිවිත.

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v) ඉතා අලජ්පී වූ දුෂ්ට වූ කේවට්ටයා අසු නැඟී, කටින් ලේ දම - දමා නළලේ ලේ පිස - පිස දිවන්නේ ය ; සේනාවට ආසන්න ව අසු පිට ම හිඳ, "පින්වත්නි, නො යවඃ මම ගොවියා පුතු නොවැන්දෙමි. සිටුව, සිටුව" යි කී ය.

(අ) ඉහත උද්ධෘතයෙහි සඳහන් ශබ්දාලංකාරය ලියන්න.

(ආ) මෙම පාඨය හා සම්බන්ධය හා අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 4 × 5= 20)

03. (අ) අවස්ථාවට උචිත පරිදි උපහැරණ මගින් උපදෙස් ලබා දීමත්

(ආ) සංයමයෙන් යුතුව උපදෙස් දීමත්

නිසා උපදේශාත්මක ජනකවිය සහෘද සිත් බැඳ ගනී. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(අ) චරිත නිරූපණයේ විශිෂ්ටතාවත්

(ආ) බස හැසිරවීමේ කුසලතාවත් නිසා

බැද්දේගම නවකතාව උසස් සාහිත්‍ය නිර්මාණයක් වී ඇත. නියමිත කොටස ඇසුරින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. (අ) අසන්නා තුළ සංකල්ප රූප මැවෙන පරිදි අවස්ථා නිරූපණයත්,

(ආ) අඟුල්මල් දමනයෙන් හෙළි වන තත්කාලීන සමාජ තොරතුරුත්

අමාවතුරෙහි විශිෂ්ටත්වය වඩාත් තීව්‍ර කරයි. එක් කරුණක් සඳහා උදාහරණ දෙකක් බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(අ) ධර්මසේන හිමියන් තුළ වූ සානුකම්පිත දෘෂ්ටියත්

(ආ) කථා වස්තුව තුළින් අපට ලබා දෙන ජීවිතාදර්ශත්

නිසා උග්ගසේන සිටුපුත්හුගේ කථා වස්තුව ශ්‍රාවක සිත් සතන් දිනා ගැනීමට සමත් වෙයි. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

- **05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. සිංහබාහු නාට්‍යයේ ලෙන අතහැර යාම නම් නිර්දිෂ්ට කොටස තුළින් ශෛලිගත නාට්‍ය සම්ප්‍රදාය ඉස්මතු කෙරේ. සුදුසු නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 10)

06. අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී ගුත්තිල කවියා මනා සමතෙකි. උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

07. සතර කන් මන්ත්‍රණයෙන් හෙළි වන තත්කාලීන සමාජ තොරතුරු කවරේ ද යි සුදුසු නිදසුන් තුනක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (1) | 11 - (4) | 21 - (1) | 31 - (2) |
| 2 - (4) | 12 - (1) | 22 - (4) | 32 - (1) |
| 3 - (2) | 13 - (3) | 23 - (2) | 33 - (3) |
| 4 - (2) | 14 - (4) | 24 - (3) | 34 - (4) |
| 5 - (3) | 15 - (3) | 25 - (1) | 35 - (2) |
| 6 - (4) | 16 - (2) | 26 - (4) | 36 - (3) |
| 7 - (1) | 17 - (1) | 27 - (2) | 37 - (1) |
| 8 - (3) | 18 - (4) | 28 - (3) | 38 - (4) |
| 9 - (2) | 19 - (2) | 29 - (1) | 39 - (2) |
| 10 - (3) | 20 - (3) | 30 - (4) | 40 - (3) |

## II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගි

01 (i) උක්තාඛ්‍යාත පද සම්බන්ධය නිවැරදිව ලියා ඇති අර්ථවත් වාක්‍යයට ලකුණු පිරිනමන්න.

(අ) ප්‍රධාන - ප්‍රමුඛ, මූලික (ආ) ප්‍රදාන - පරිත්‍යාගය, මහා දානය

(ii) (අ) ශිෂ්ටාචාරය (ආ) ව්‍යූහය

(iii) (අ) සමය - කාලය / ආගම / යුගය (ආ) වැසි - වාසය කරන / වර්ෂාව / වැසුණු

(iv) (අ) ස්වයංක්‍රීය (ආ) ශ්‍රැතිගෝචර / ශ්‍රව්‍යගෝචර

(v) (අ) උද්‍යානයක් - ආගම සන්ධිය (ආ) වචනාර්ථ - ස්වරාදේශ සන්ධිය

(vi) (අ) පැරණි කවින් විසින් ගැමි හදවත් හඳුනා ගනිමින් කවි ලියන ලදී. / පැරණි කවිහු ගැමි හදවත් හඳු ගනිමින් කවි ලියූහ.

(ආ) ඔහු ප්‍රවීණ සාහිත්‍යධරයෙකු මෙන් ම දක්ෂ ගොවියෙක් ද විය.

(vii) නම් / හා / ය

(viii) (අ) ඌෂ්මාක්ෂර (ආ) දන්තජ අක්ෂර

(ix) (අ) පලයන් / යන්ටකෝ (ආ) විසි කළා

(x) (අ) රෝගීන් විසින් වෛද්‍ය උපදෙස් පතන ලදී. / පැතිණි, / පතනු ලැබිණි.

(ආ) ජයග්‍රාහකයන් විසින් සතුටින් ඔල්වරසන් දෙනු ලැබේ. / දෙනු ලබයි. / දෙනු ලැබෙයි.

02 රචනය සඳහා

1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 08
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය ලකුණු 12
3. ශිල්පීය දක්ෂතා ඡේද බෙදා ලිවීම ලකුණු 05

මුළු ලකුණු 25 යි.

03 සාරාංශය

1. අන්තර්ගතය ලකුණු 06
2. වචන ගණන ලකුණු 02
3. ශිල්පීය දක්ෂතා ලකුණු 02

★ කාව්‍ය නිර්මාණය සඳහා අවශ්‍ය ප්‍රතිභාව අඩු වුවත් බහු ශ්‍රැත භාවය හා අත්දැකීම් වලින් යුක්ත වේ සතතාභ්‍යාසය මගින් කාව්‍ය නිර්මාණයට යොමු වීමෙන් කවියෙකු විය හැකිය.

04 අවබෝධය

1. පොදු භාෂාවක් නිසා එකමුතු බව ලැබූ ජන සමූහය
2. පොදු භාෂාව
3. අන්‍යයන්ට සිතිවිලි දක්වීම සඳහා
4. භූගෝලීය වශයෙන් එක් ප්‍රදේශයකට සීමාවීම
5. සිංහල භාෂා ප්‍රජාව හා දෙමළ භාෂා ප්‍රජාව

එක් නිවැරදි උත්තරයකට ලකුණු 02 බැගින් $2 \times 5 = 10$යි.

05 රාජකාරි ලිපිය

| | | |
|---|---|---|
| ආකෘතිය | - | ලකුණු 04 |
| අන්තර්ගතය | - | ලකුණු 03 |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 03 |
| මුළු ලකුණු | | 10 |

න්‍යාය පත්‍රය ලකුණු 15
ආකෘතිය - ලකුණු 04
අන්තර්ගතය - ලකුණු 08
ශිල්පීය දක්ෂතා - ලකුණු 03
මුළු ලකුණු 15

## III කොටස

1 (i) (අ) ගංගාවේ සංගීතය (ආ) එච්.එම්. කුඩලිගම මහතා
(ii) (අ) කොසොල් රජතුමා (ආ) පොළොන්නරු සාහිත්‍ය යුගය
(iii) (අ) පරමත්ථ ජෝතිකාව (ආ) දූනමුතුකමට කී කවි
(iv) (අ) වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයා
(ආ) මහෞෂධ පඬිතුමාත් කේවට්ටාචාරීනුත් හමුවීමේ දී ඒ දෙදෙනාගෙන් කෙනෙක් අනෙක් කෙනාට වැන්දේ නම් වැඳි කෙනා ජයත් අනෙකා පරාජයත් ලබයි.
(v) (අ) පුංචි රාළ / වෙද රාළ (ආ) තංගල්ල හිර ගෙදර
(vi) (අ) ගජ සෙන් සිතියම් ගජ සිරි කීයෙලී
(ආ) පියසන් - පියාපත් සැලුම් මද සන්සුන් - මද සන්සිඳුණු
(vii) (අ) සද්ධර්ම රත්නාවලිය (ආ) පාලි ධම්ම පදට්ඨ කථාව
(viii) (අ) ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායට
(ආ) මහා වංශයෙහි සඳහන් සිංහල ජාතිය බිහි වීම පිළිබඳ කතා පුවත.
(ix) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි (ආ) ඔවා මුතු
(x) (අ) පාලි, සංස්කෘත භාෂා නුගත් සාමාන්‍ය ජනයා සඳහා සිංහල බසින් ලිවීම.
(ආ) පුරිස දම්ම සාරථී (ලකුණු 2 x 10 = 20)

2 (i) (අ) • සද්ධර්ම රත්නාවලියෙහි උග්ගසේන සිටුපුත්හුගේ වස්තුවේ සඳහන් උග්ගසේන සිටුපුත් බුදුන් වහන්සේගේ දැනුම් දීම මත හුණ දඬු අග ශිල්ප දක්වා, සදහම් අසා රහත් වූ අවස්ථාව.
(ආ) කර'ග රහත් වන්නා සේ.
(ii) (අ) මිගිඳා - සිංහරාජයා මුකුරා - මුහුකුරා / වර්ධනය වී.
(ආ) සිංහයාගේ හැඩරුව මනාව පෙනීම / මුසාබස් නොපිළිගැනීම / නුවණ මුහුකුරා යාම / වයස මුහුකුරා යාම
(iii) (අ) අනංගයාගේ - කුසුමසරාගේ හිස් මුදුනේ - සරාගේ
(ආ) අනංගයාගේ දීප්තිමත් කීර්තිය වැනි සුවඳ නො මිදුණා වූ මල් හිස් මුදුනෙහි පැළඳ නටන්නා වූ දිව්‍යාංගනා රංග විලාසය දක්නා කල්හි කවරෙකුගේ සිත කෙලෙසක උමතු නො වන්නේ ද?
(iv) (අ) බැවැහර - ව්‍යවහාර / භාවිත
පිළිවිත - විමසුවේ ය / විචාළේ ය.
(ආ) අමාවතුරෙහි අඟුල්මල් දමනයෙහි සඳහන් කොසොල් රජු දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් වහන්සේ බැහැ දක අඟුල්මල් තෙර පිළිබඳ දැන උන් වහන්සේ මුණ ගැසී සාකච්ඡා කළ අවස්ථාව.
(v) (අ) අනුප්‍රාසය
(ආ) සතර කන් මන්ත්‍රණයේ ධර්ම යුද්ධයෙන් පැරදී පලා යන සේනාව නැවැත්වීමට කේවට්ට බමුණා, ඔවුන් පසු පස හඹා යන අවස්ථාව
(ලකුණු 4 x 5 = 20)

3,04 ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට උදාහරණ 04 ක් සඳහා ලකුණු = 04
සමස්ත විස්තරයට ලකුණු = 11
මුළු ලකුණු = 15 බැගින් 02 = 30

5,06,07 ප්‍රශ්න සඳහා උදාහරණ තුනක් සඳහා ලකුණු = 03
සමස්ත විස්තරයට ලකුණු = 07
මුළු ලකුණු = 10 යි